මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| | | | | | |
|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යාව I | 8 | S | I | 13 ශ්‍රේණිය | පැය දෙකයි |

උපදෙස් - * සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1-50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1)(2)(3)(4)(5) යන පිළිතුරු වලින් නිවරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිලිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

## A කොටස

- අංක 1සිට 50 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. පහත සඳහන් ශාක අතරින් කෙටි දින ශාකයක් වන්නේ,
(1) ස්ට්‍රෝබෙරි (2) බීට (3) නිවිති (4) තේ (5) මුං

2. කෘෂිකාර්මික අතුරු නිෂ්පාදනවලට උදාහරණයකි,
(1) බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
(2) වී සහ සහල් නිෂ්පාදනය
(3) කිරි හා බිත්තර නිෂ්පාදනය
(4) කොහුබත් හා මොලැසස් නිෂ්පාදනය
(5) බිම්මල් හා කැපූ මල් නිෂ්පාදනය

3. පසක් පවතින සංඝටක කිහිපයක් පහත පරිදි වේ.
A - පාංශු වාතය B- පාංශු ජලය C- පාංශු කාබනික ද්‍රව්‍ය D - පාංශු ඛනිජ
ඉහත සංඝටක අතරින් පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය ට අත්‍යවශ්‍ය වන්නේ,
(1) A,B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා D පමණි. (5) A, B හා C පමණි.

4.



ඉහත රූප සටහනේ දැක්වෙන වර්ෂාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) උත්තර අර්ධගෝලයට ශිම්හාන ඍතුව උදාවේ.
(2) නිරන්තරයෙන් අධික වර්ෂාවක් ලබා දේ,
(3) බස්නාහිර, සබරගමුව, දකුණු පළාත් වලට ගංවතුර තත්ව ඇතිවේ.
(4) දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය තුළ ඇති වේ.
(5) සුළං ධාරාව ඉන්දියන් සාගරය හරහා හමා එයි.

5. බීජ පරීක්ෂා කිරීම සඳහා විද්‍යාගාරයක තිබූ බීජ සාම්පල් සහිත මලු අතරින් ලියාපදිංචි බීජ වෙන්කර ගැනීමට අවශ්‍යය විය. එය අඩංගු ලේබලයේ වර්ණය විය හැක්කේ
(1) සුදු පාටය. (2) ලා කොල පාටය. (3) ලා නිල් පාටය.
(4) රෝස සහ සුදු පාටය. (5) නිල් සහ සුදු පාටය.

6. පහත සඳහන් ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය අතරින් ශාකතුල දක්නට ලැබෙන සචල පෝෂකයක් වන්නේ,
(1) Mn (2) B (3) Cl (4) Cu (5) Fe

7. ප්‍රධාන වශයෙන් ද්විතියික බිම් සැකසීමට යොදාගන්නා උපකරණයක් වුවද ප්‍රාථමික බිම් සැකසීමට යොදා ගන්නා උපකරණයක් වනුයේ,
(1) කොකු නගුල (2) රොටවේටරය (3) තැටි නගුල
(4) ඇණ දත් පෝරුව (5) රිජරය

8. ශ්‍රී ලංකාවේ මෑතකදී ක්‍රියාත්මක කරන ලද මොරගහකන්ද සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා ජල පෝෂක ය වන්නේ,
(1) මහවැලි ගඟ (2) කළු ගඟ (3) මල්වතු ඔය
(4) නිල්වලා ගඟ (5) කැලණි ගඟ

9. ශාකයක් තුල සිදුවන උත්ස්වේදන ක්‍රියාවලිය හා වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන ප්‍රස්ථාරය වන්නේ,


(1)


(2)


(3)


(4)


(5)

10. බෝග වගා ක්ෂේත්‍රයක වාෂ්පීකරණ උත්ස්වේදන වේගය දිනකට 5.5 mmකි. එම වගා ක්ෂේත්‍රයේ ක්ෂේත්‍ර ධාරිතාවේදී පසෙහි තෙතමනය 95mm කි. මෙම වගා ක්ෂේත්‍රය සඳහා වඩාත් සුදුසු ජල සම්පාදන කාලාන්තරය වන්නේ,
(1) දින 10 (2) දින 8 (3) දින 17 (4) දින 9 (5) දින 18

11. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයකදී ලබා ගන්නා කාලගුණික දත්ත ඇසුරෙන් ලබාගත් දින උදේ හා සවස ලෙස සටහන් කරන පාඨාංකයක් වන්නේ,
(1) වර්ෂාපතනය (2) සාපේක්ෂ ආර්ද්‍රතාවය (3) සුළඟේ වේගය
(4) ආලෝක තීව්‍රතාව (5) උපරිම හා අවම උෂ්ණත්වය

12. නිර්පාංශු වගාව සඳහා ඝන මාධ්‍යයක් තේරීමේදී සලකා බැලිය යුතුය කරුණක් වන්නේ,
(1) ස්වාරක්ෂක බවින් තොර වීමය. (2) ජල වහනය සෙමින් සිදුවීමයි.
(3) ප්‍රශස්ථ වාතනයක් පැවතීමයි. (4) හංගුර බවින් තොර වීමයි.
(5) නම්‍යශීලී නොවීමයි.

13. මැටි පසක ව්‍යුහය විනාශ වීම නිසා පසෙහි ඇති විය හැකි ප්‍රධාන වෙනස්කමක් වන්නේ,
(1) සවිවරතාවය හා දෘශ්‍ය ඝනත්වය අඩුවීමයි. (2) සවිවරතාවය හා දෘශ්‍ය ඝනත්වය වැඩිවීමයි.
(3) සවිවරතාවය වැඩි වී දෘශ්‍ය ඝනත්වය අඩුය වීමයි. (4) දෘශ්‍ය ඝනත්වය වැඩි වී සවිවරතාව අඩු වේ.
(5) සත්‍ය ඝනත්වය හා දෘශ්‍ය ඝනත්වය අඩු වීමයි.

14. අතු කැබලි මගින් ශාක ප්‍රචාරණය සම්බන්ධ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ
A- ලා දඬු වල සංචිත ආහාර අඩු නමුත් ශාක හෝර්මෝන ප්‍රමාණය වැඩිය.
B - රෝස,බෝගන්විලා ලා දල දඬු මගින් ප්‍රචාරනය කරන ශාක වේ.
C - දඬු කැබලි මුල් ඇද්ද වීමට ඉහල උෂ්ණත්වයක් පහල සාපේක්ෂ ආර්ද්‍රතාවක් අවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතුරින් සත්‍යප්‍රකාශය/ප්‍රකාශ වන්නේ
(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) A හා C පමණි
(5) B හා C පමණි.

15. අපරිණිත කොම්පෝස්ට්වල ලක්ෂණයක් වන්නේ,
(1) කාබනික අම්ල ඉතා සුලු වශයෙන් අඩංගු වීම.
(2) ක්ෂුද්‍ර ජීවීන් රහිත වීම.
(3) pH අගය අවම හෝ ඉතා වැඩි අගයක් ගැනීම
(4) ඉතා අඩු ලවණ සාන්ද්‍රණයක් සහිත වීම.
(5) දිරාපත් නොවූ කාබනික ද්‍රව්‍ය අඩංගු වීම.

16. ශාකයක උස් (T) මිටි (t) බවට ප්‍රමුඛ වේ.එම ශාකයේ රතු පැහැ (R) මල් හට ගැනීම කහපැහැ (r) මල් හට ගැනීමට ප්‍රමුඛ වේ. විෂමයෝගී උස රතු පැහැ මල් දරන ශාකයක් සමයෝගී උස කහ පැහැති මල් දරන ශාකයක් සමඟ මුහුම් කළ විට $F_1$ පරම්පරාවේ උස රතු පැහැති මල් දරන ශාක ලැබීමේ අනුපාතය,
(1) 1/2 (2) 2/3 (3) 1/4 (4) 3/16 (5) 9/16

17. පාලිත තත්ත්ව යටතේ බෝග වගාව සඳහා යොදා ගන්නා අර්ධ ස්ථිර ආරක්ෂිත ව්‍යුහයක් ලෙස සැලකිය හැක්කේ,
(1) හරිතාගාරය (2) ජේළි ආවරණය (3) ශීත රාමුය
(4) පොලිතීන් උමංය (5) ජල සංරක්ෂක ව්‍යුහය

18. ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් ඇන්තූරියම් පැළ ලබා ගන්නා අවස්ථාවක , එක්තරා පියවරක් එහි මාධ්‍යයෙහි ඔක්සින හෝර්මෝන සාන්ද්‍රණය වැඩි කරයි. එයට හේතුව වන්නේ,
(1) කිණක වර්ධනය උත්තේජනය කිරීමට
(2) අංකුර වර්ධනය උත්තේජනය කිරීමට
(3) මුල් වර්ධනය උත්තේජනය කිරීමට
(4) කිණක හා අංකුර වර්ධනය උත්තේජනය
(5) අංකුර හා මුල් වර්ධනය උත්තේජනය කිරීමට

19. කුඩා ජල පහර වලින් ජලය එසවීම සඳහා යොදා ගන්නා ජල එසවුම් ක්‍රමයක් වන්නේ,
(1) කප්පි (2) අක්ෂීය ධාරා පොම්ප (3) කේන්ද්‍රාපසාරී පොම්පය
(4) ආඩියා ළිඳ (5) පැද්දෙන ගොටුව

20. පාලිත පරිසර තත්ත්ව යටතේ බෝග වගාව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
(1) මෙහිදී අස්වැන්න ගුණාත්මකව වැඩි වුවද ප්‍රමාණාත්මකව වැඩි කළ නොහැක.
(2) ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව සිදු කළ හැකි වන්නේ අදාළ අස්වැන්න ලබා දෙන කාල වකවානුව තුල පමණි .
(3) රෝග හා පළිබෝධ පාලනය අවම මට්ටමකින් සිදුකළ හැක.
(4) ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව කාබනික යෙදවුම් පමණක් යොදා ගනිමින් සිදු කළ හැක.
(5) මෙහිදී පසේ pH අගය පෝෂක ප්‍රමාණය හා පාංශු තෙතමනය පාලනය කිරීම ඉතා වැදගත්වේ.

21. පළිබෝධනාශක යෙදීමට යොදා ගන්නා උපකරණයක් පහත දැක්වේ.



එම උපකරණයේ අවශ්‍ය විට පළිබෝධනාශක ඉසීමට සැලසීම හෝ එය නැවැත්වීම සිදු කරන ව්‍යුහය වන්නේ,

(1) A (2) B (3) C (4) D (5) E

22. ගවයින්ගේ සාමාන්‍ය කිරිවලට සාපේක්ෂව මුල් කිරිවල,
(1) ඛනිජ ප්‍රතිශතය අඩුය.
(2) විටමින් ප්‍රතිශතය අඩුය.
(3) උකුභාවය අඩුය.
(4) ප්‍රෝටීන් ප්‍රමාණය අඩුය.
(5) ලැක්ටෝස් ප්‍රතිශතය අඩුය.

23. ආහාර පරිරක්ෂණ ක්‍රමයක් ලෙස අධිශීතකරණය යොදා ගැනීම සම්බන්ධ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.
A - කඩිනම් අධිශීතනයේදී කුඩා අයිස් කැට සැදීම නිසා ආහාරයේ ගුණ හානිවීම අඩුය.
B - කඩිනම් අධිශීතනයේදී ආහාරයේ දියර පිටතට කාන්දු වීම සිදුවේ.
C - ආහාර අධිශීතනය කිරීමෙන් ආහාරයේ මේද ඔක්සිකරණය අවම වේ.
මෙම ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

24. කෘෂි ව්‍යාපාරයක් සංවිධානය කිරීමේ මූලික පියවරක් වනුයේ,
(1) ක්‍රියාවලි සැලසුම් කිරීමය.
(2) මානව සම්පත් කළමණාකරණය.
(3) සම්පත් බෙදා හැරීමය.
(4) නායකත්වය ලබා දීමය.
(5) අභිප්‍රේරණය සිදු කිරීමය.

25. ක්ෂාරීය පසක ලක්ෂණයක් වන්නේ,
(1) pH අගය 7 - 8.5 අතර වීමය.
(2) pH අගය අතර 8.5 ට වැඩි වීමය.
(3) විනිමය කළහැකි $Na^+$ ප්‍රතිශතය 20% ට වැඩිවීම ය.
(4) විද්‍යුත් සන්නායකතාව සෙන්ටිමීටරයට මිලිමෝස් 4 ට වඩා වැඩි වීමයි.
(5) $Na^+$ බහුලව ඇත්තේ පාංශු ද්‍රාවණයේ ය.

26. ගොඩ බෝගවල බීජ ක්‍රමවත්ව සිටුවීමට යොදා ගන්නා බීජ වප්කරය වන්නේ,
(1) වික්‍රමසේකර බීජ වප්කරය
(2) ජෝන් පුල්ලේ බීජ වප්කරය
(3) FMRC දෙපේලි බීජ වප්කරය
(4) පේළි හයේ බෙර රෝද බීජ වප්කරය
(5) ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය

27. පහත රූප සටහනින් නිරූපණය වන්නේ,



(1) ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය යි.(DFT)
(2) නොගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය යි.(NFT)
(3) මුල් ගිල් වූ වගාවයි. ( root dipping Technique)
(4) කේශික අවශෝෂණ වගාවයි.( capillary action technique)
(5) පාවෙන වගාවයි. ( Floating Technique)

28. බද්ධ කිරීම සම්බන්ධ නිවැරදි වගන්තිය වන්නේ,
(1) පැළ බද්ධය බහුලව යොදා ගන්නා රිකිලි බද්ධ ක්‍රමයකි.
(2) පැලුම් රිකිලි බද්ධයේ ග්‍රාහකයේ හා අනුජයේ විෂ්කම්භය සමාන විය යුතු ය.
(3) කිරුළු බද්ධයේ අනුජය කොටස ග්‍රාහකයට වඩා විශාල විය යුතුය.
(4) හරිත බද්ධයේදී ග්‍රාහකය හා අනුජය සම්බන්ධ කළ බද්ධ සන්ධිය බද්ධ පටි වලින් එතීම සිදුකරයි.
(5) අංකුර බද්ධය සාර්ථක වීමෙන් පසු බද්ධ සන්ධිය පහළින් ග්‍රාහකයේ කොටස් කපා ඉවත් කරයි.

29. පාංශු සෞඛ්‍ය නිසිලෙස පවත්වාගැනීමේදී ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කළයුතු රසායනික ලක්ෂණයක් වන්නේ
(1) පාංශු සංස්ථිතිය යි. (2) පාංශු වර්ණයයි. (3) පාංශු ප්‍රතික්‍රියාව යි.
(4) කාබනික ද්‍රව්‍ය වියෝජනය යි. (5) පසෙහි දෘශ්‍ය ඝනත්වය යි.

30. වියළි කලාපයේ අධික සුළං සහිත ප්‍රදේශයක පේළියට වගාකර ඇති වැල් දොඩම් වගාවක් සඳහා වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,
(1) තීරු ජල සම්පාදනය (2) විසිරි ජල සම්පාදනය (3) බිංදු ජල සම්පාදනය
(4) බේසම් ජල සම්පාදනය (5) ඇලි වැටි ජල සම්පාදනය

31. ඉදීමේදී හා වයසට යෑමේදී ශ්වසන වේගය උපරිමය පෙන්වන පලතුරක් වන්නේ,
(1) වෙරි (2) පෙයාස් (3) මිදි (3) දොඩම් (5) ස්ට්‍රෝබෙරි

32. බිත්තරයක් පරීක්ෂා කිරීමේදී පහත ලක්ෂණ දැකිය හැකි විය.
A - කහමදය මාධ්‍යය වන්නට තිබීමය.
B - බර 56 g වීම.
C - කවචය ඝනකම් වීම.
මෙම බිත්තරය රක්ක වීම ට නොහැකි වීමට හේතු විය හැක්කේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) B හා C පමණි. (5) A හා C පමණි.

33. වෙළඳ පොළ සමතුලිතතාවේදී ඉල්ලුම හා සැපයුම ශ්‍රිත පිළිවෙලින්
$Q dx = 50+2 P$
$Q sx = 3 P - 70$ වේ නම් භාණ්ඩයේ සමතුලිත මිල වනුයේ,
(1) රු. 20 කි. (2) රු. 120 කි. (3) රු. 22 කි. (4) රු. 70 කි. (5) රු. 50 කි.

34. කෘමීන්ගේ අපර පියාපත් තෝලක බවට පත් වී ඇත්තේ කුමන ගෝත්‍රයේ කෘමීන්ගේද?
(1) Orthoptera (2) Lepidoptera (3) Isoptera (4) Diptera (5) Coleoptera

35. ගොඩබිම වැවෙන වාර්ෂික වල්පැළෑටියකි.
(1) ගඳපාන (2) කලා දුරු (3) කුප්පමේනියා (4) බජිරි (5) මාරුක්

36. කෘෂි වගා බිම සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - මිල අධික යෙදවුම් භාවිතය
B - නවීන ජල සම්පාදන ක්‍රම භාවිතය
C - රෝග හා පළිබෝධ හටගැනීම
ඉහත කරුණු අතරින් කෘෂි වන වගා අස්ථායි වීමට බලපානු යේ
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) ඉහත කිසිවක් නොවේ.

37. කිකිළියන් A සංඛ්‍යාවක් ඇති ගොවිපොළට ආහාර Bg ප්‍රමාණයක් සංඛ්‍යාවක් ලබා දෙනවිට බිත්තර C ප්‍රමාණයක් ලබා දෙයි. කිකිළියකගේ ආහාර පරිවර්තන අනුපාතය වන්නේ,

(1) B/C ය. (2) $\frac{AxB}{C}$ ය. (3) BA/C ය. (4) $\frac{AxC}{B}$ ය. (5) C /B ය.

38. රෝමාන්තිකයින්ගේ ආහාර ජීර්ණ ක්‍රියාවලියට අදාල ක්‍රියාවන් කිහිපයක් පහත දැක්වේ.

A සෙලියුලෝස් → වාෂ්පශීලි මේද අම්ල
B මේදය → මේද අම්ල, ග්ලිසරෝල්
C ප්‍රෝටීන→ ක්ෂුද්‍රජීවී ප්‍රෝටෝන
D ක්ෂුද්‍ර ජීවී ප්‍රොටීන → පෙප්ටයිඩ

ඉහත ක්‍රියාවලින් අතරින් ක්ෂුද්‍ර ජීවීන්ගේ දායකත්වයක් දැකිය හැක්කේ,

(1) A හා B සඳහා පමණි.
(2) A,B හා C සඳහා පමණි.
(3) A හා C සඳහා පමණි.
(4) A,C හා D සඳහා පමණි.
(5) B , C හා D පමණි.

39. බැක්ටීරියා රෝග ලක්ෂණයක් වන්නේ,

(1) කොළ පුල්ලි ඇතිවීමය. (2) ප්‍රාදේශික පුල්ලි ඇතිවීමය (3) මුදු ලප ඇති වීම.
(4) පිළිකා ඇතිවීමය. (5) විචිත්‍ර ය.

40. ගොවි මහතෙකු පළිබෝධනාශක ලේබලය නිරීක්ෂණය කළවිට එහි නිල්පාට තීරුවක් ඇතිබව දුටුවේය. ඒ අනුව පළිබෝධනාශකය,

(1) උග්‍ර විෂ සහිතය. (2) අඩු විෂ සහිතය (3) ඉතා අඩු විෂ සහිතය.
(4) මධ්‍යම විෂ සහිතය. (5) විෂ නොමැත.

41. ආයතනයක ලාභය උපරිම වන්නේ,

(1) සම නිෂ්පාදන වක්‍ර හා සම පිරිවැය රේඛා එකිනෙක ස්පර්ශ වීමේදී ය.
(2) නිෂ්පාදන ශ්‍රිතයක පළමු අවධියේදී ය.
(3) සාමාන්‍ය නිෂ්පාදනය ආන්තික නිෂ්පාදනයට වැඩි අවස්ථාවේ දීය.
(4) සම ආදායම් වක්‍රය හා සම පිරිවැය රේඛා එකිනෙක ස්පර්ශ වීමේදී ය.
(5) රාජ්‍ය ප්‍රතිපත්ති ලිහිල් කළ අවස්ථාවේදී ය.

42. පසු අස්වනු හානියට හේතු වන එතිලීන් නිෂ්පාදනය ඉහළ යාමට බලපාන හේතුවක් වන්නේ,

(1) ඵලයේ අභ්‍යන්තර තෙතමනය. (2) පරිසර උෂ්ණත්වය අඩුවීම.
(3) අපරිණත ඵල නෙලීම. (4) සාපේක්ෂ ආර්ද්‍රතාව අඩුවීම.
(5) යාන්ත්‍රික හානි සිදුවීම.

43. ගිබරලින්වල කෘෂිකාර්මික භාවිතය ක් වන්නේ,

(1) බීජ ප්‍රරෝහණය (2) පත්‍ර වෘද්ධතාවය (3) බීජ සුප්තතාවය ඉවත් කිරීම.
(4) ඵල ඉදවා ගැනීම. (5) පුෂ්පීකරණය.

44. ශ්‍රී ලංකාව වැනි රටවල ශ්‍රම සූක්ෂම කර්මාන්ත සුලභ වීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ආයෝජකයින් කෘෂිකර්මාන්තයට වැඩි ප්‍රාග්ධනයක් යෙදවීම.
B - අනෙක් රටවලට සාපේක්ෂව වැඩිපුර ශ්‍රමය පැවතීම.
C - ප්‍රාග්ධනය හිඟ වීම.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකා ශය වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි. (3) B පමණි.
(4) C පමණි. (5) B හා C පමණි.

45. ආහාර නරක් වීමට සම්බන්ධ ක්‍රියාවලියකට අයත් සමීකරණයක් පහත දැක්වේ.

කැටිකෝල් + ඔක්සිජන් $\xrightarrow{\text{එන්සයිම}}$ බොන්සොක්විනෝන්

ඉහත ප්‍රතික්‍රියාව වන්නේ,

(1) පැසීමයි.
(2) එන්සයිමීය දුඹුරු වීමයි.
(3) කැරමලීකරණයයි.
(4) මෙලාඩිකරණය යි.
(5) මුඩු වීමයි.

46. ආන්තික ආදායම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මුළු නිෂ්පාදනය, නිෂ්පාදක ඒකක මිලෙන් ගුණ කිරීමෙන් ලබා ගත හැක.
B - විචල්‍ය යෙදවුම් ඒකකය වෙනස් වීම මුළු නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වූ වෙනසයි.
C - ප්‍රශස්ථ යෙදවුම් අවස්ථාවේ ආන්තික වියදමට සමාන වේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) B හා C පමණි.

47. මානව පෝෂණයේදී ඌනතා හේතුවෙන් මානව සෞඛ්‍ය ගැටළු ඇතිවේ. පහත වරණ අතුරින් පෝෂක ඌනතාවය හා ගැලපෙන පෝෂණ ගැටලුව වන්නේ,

(1) යකඩ ඌනතාවය - ගලගණ්ඩය
(2) විටමින් A ඌනතාවය - සිරෝතැල්මියාව
(3) අයඩින් ඌනතාවය - මැරස්මස්
(4) ප්‍රෝටීන ඌනතාවය - නිරක්තිය
(5) සින්ක් ඌනතාවය - දත්වල සුදු පුල්ලි ඇතිවීමය.

48. කාබනික ගොවිතැනට පදනම් වන මූලධර්ම අඩංගු වරණය වනුයේ,

(1) රසායන ද්‍රව්‍ය තොරබව , සාධාරණත්වය, සැලකිලිමත් බව ,සෞඛ්‍ය
(2) රසායන ද්‍රව්‍ය තොරබව, සෞඛ්‍ය, පරිසර විද්‍යා මූලධර්ම, සාධාරණත්වය
(3) කාබනික ප්‍රභවයන් භාවිතය, සාධාරණත්වය සෞඛ්‍ය, සැලකිලිමත් බව
(4) කාබනික ප්‍රභවයන් භාවිතය, පරිසර විද්‍යා මූලධර්ම, සෞඛ්‍ය, සාධාරණත්වය
(5) සාධාරණත්වය, සෞඛ්‍ය, පරිසර විද්‍යා මූලධර්මය, සැලකිලිමත් බව

49. තාක්ෂණික භාවිතයන් හේතුවෙන් සමහර දේශීය බෝග වඳ වීමේ තර්ජනයට ලක්ව වී ඇත. එම තත්වයට හේතුවක් විය හැක්කේ,

(1) අධික ලෙස වගාවන් සඳහා රසායනික පොහොර යෙදීමයි.
(2) අධික ලෙස වගාවන් සඳහා පළිබෝධ නාශක යෙදීමයි.
(3) බීජ රහිත පළතුරු වගාවට යොමු වීමයි.
(4) දේශීය බෝග වල මිල අධික වීමය.
(5) ගොවීන්ට නිසි තාක්ෂණික දැනුමක් නොමැතිවීමයි.

50. එක්තරා ගොවි මහතෙකුට සිය ගොවිපොලේ වැඩ කිරීමෙන් පසු පහත රෝගී ලක්ෂණ පහළ විය.

A - කොන්දේ වේදනාව
B - නිදිමත/අලසබව
C - ආහාර අරුචිය
D - උණ හැඟීම, බැසීම
E - දේහ බර අඩුවීම

ඔහුට වැළඳී ඇති රෝගය විය හැක්කේ,

(1) වෛරස් උණ
(2) මැලේරියාව
(3) බෲසෙල්ලෝසිස්
(4) ඩෙංගු උණ
(5) මී උණ

***

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කෘෂි විද්‍යාව

**13 ශ්‍රේණිය පෙරහුරු පරීක්ෂණය 2024**

**1 පත්‍රය පිළිතුරු පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | **1** | 11 | **2** | 21 | **3** | 31 | **2** | 41 | **1** |
| 2 | **4** | 12 | **3** | 22 | **5** | 32 | **3** | 42 | **5** |
| 3 | **5** | 13 | **3** | 23 | **4** | 33 | **2** | 43 | **3** |
| 4 | **4** | 14 | **1** | 24 | **3** | 34 | **4** | 44 | **5** |
| 5 | **2** | 15 | **3** | 25 | **2** | 35 | **3** | 45 | **2** |
| 6 | **3** | 16 | **1** | 26 | **3** | 36 | **4** | 46 | **3** |
| 7 | **1** | 17 | **4** | 27 | **2** | 37 | **2** | 47 | **2** |
| 8 | **2** | 18 | **3** | 28 | **2** | 38 | **3** | 48 | **5** |
| 9 | **3** | 19 | **5** | 29 | **3** | 39 | **1** | 49 | **3** |
| 10 | **2** | 20 | **5** | 30 | **3** | 40 | **2** | 50 | **3** |

[All Rights Reserved]

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

කෘෂි විද්‍යාව II | 8 S II | 13 ශ්‍රේණිය

උපදෙස් - * ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

(05) 1) ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාපවලට වෙන් කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
2) කෘෂිකාර්මික ක්ෂේත්‍රයක කෘමි පලිබෝධ පාලනයට යොදා ගත් හැකි ක්‍රම විස්තර කරන්න.
3) පසක දෘශ්‍ය ඝනත්වය සහ සවිවරතාවය බෝග වගාවට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(06) 1) ශ්‍රී ලංකාවේ බෝග වගා ක්ෂේත්‍රය දියුණු කිරීමට පවතින විභවයන් විස්තර කරන්න.
2) අස්වනු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානි වලක්වා ගැනීමට යොදා ගත් හැකි උපාය මාර්ග විස්තර කරන්න.
3) කොම්පෝස්ට් පොහොර සෑදීමේදී සිදුවන විද්‍යාත්මක ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(07) 1) නිර්පාංශු වගාවේදී භාවිතා වන ජල රෝපිත වගාවේ සංසරණය නොවන වගා ක්‍රම විස්තර කරන්න.
2) කිකිළි බිත්තරයක එක් එක් කොටසෙන් සිදුවන කාර්යය රූප සටහනක් ඇසුරෙන් විස්තර කරන්න.
3) බෝග වගාව සඳහා ජල සම්පාදනයේ ජලය එසවීමට යොදාගන්නා පිස්ටන් ආකාර පොම්පයකට සාපේක්ෂව කේන්ද්‍රාපසාරී පොම්පය භාවිත කිරීමේ වාසි හා අවාසි විස්තර කරන්න.

(08) 1) බීජ සුප්තතාවය ඇතිවීමට හේතු සඳහන් කරමින් එම සුප්තතාවය ඉවත් කිරීමේ ක්‍රම විස්තර කරන්න.
2) සමෝධානිත ගොවිතැනේ සංරචක විස්තර කරන්න.
3) ආහාර නරක් වීමට බලපාන භෞතික සාධක විස්තර කරන්න.

(09) 1) ජාන සම්පත් හායනය සිදුවන ආකාරය විස්තර කරන්න.
2) ගොවිපොළ සත්ව සෞඛ්‍ය කළමනාකරණයේ වැදගත්කම විස්තර කරන්න
3) දේශගුණික විපර්යාස මගින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සිදුවිය හැකි බලපෑම් අවම කිරීමට ගත් හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(10) 1) වී වගාව සඳහා බිම සකස් කරන අයුරු විස්තර කරන්න.
2) කෘෂි ව්‍යාපාර සඳහා ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ වැදගත්කම විස්තර කරන්න.
3) ප්‍රභාසංස්ලේෂණයට බලපාන බාහිර සාධක විස්තර කරන්න.

***